www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005*

# පලමු වන දේශනය: රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු

*දෙවන කොටස*

**Lecture one: The Russian Revolution and the unresolved historical problems of the 20th century**

**Part 2**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 අගෝස්තු 30**

*2005 අගෝස්තු මස 14 වැනිදා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු" යන දේශනයේ දෙවන කොටස යි මේ. මේ දේශනය කොටස් හතරකින් පල කෙරේ. මෙය පාසලෙහි පැවැත්වුනු පලමු වන දේශනය යි.*

## පශ්චාත් නූතනවාදයට එරෙහි ව ඓතිහාසික සවිඥ්ඥානිකත්වය

මානව විමුක්තිය උදෙසා අරගලය තුල දී ඓතිහාසික අත්දැකීම පිලිබඳ ඥානයට හා න්‍යායික ස්වීකරනයට ඒ සා විචාරාත්මක හා තීරනාත්මක භූමිකාවක් පවරා දෙන්නා වූ අප පිලිගන්නා ඉතිහාසය පිලිබඳ සංකල්පනය, පවත්නා සියලු ධනේශ්වර චින්තන ප්‍රවනතාවන්ට සමහන් කල නොහෙන අන්දමින් සතුරු ය. ධනේශ්වර සමාජයේ දේශපාලනික, ආර්ථික හා සමාජීය ජරපත් වීම, එහි බුද්ධිමය පරිහානිය විසින් මෙහෙයවනු නොලබන්නේ නම් එය විසින් පිලිබිඹු කරනු ලැබේ. ට්‍රොට්ස්කි වරක් සඳහන් කල පරිදි, දේශපාලන ප්‍රතිගාමීත්වය පිලිබඳ කාලපරිච්ඡේදයක දී අවිද්‍යාව සිය දත් විලිස්සයි.

ධනේශ්වර චින්තනයේ වඩාත් චතුර හා නරුම ශාස්ත්‍රාලීය නියෝජිතයින්, පශ්චාත් නූතනවාදීන් විසින් අද දවසේ හොබවනු ලබන, අවිද්‍යාවේ නිශ්චිත හා විශේෂිත රූපාකාරය වන්නේ ඉතිහාසය පිලිබඳ නොතැකීම හා පිලිකුල යි. ඉතිහාසයේ වලංගුතාව ද සමාජීය චින්තනය පිලිබඳ සියලු සැබෑ ප්‍රගතිශීලී ප්‍රවනතාවන් විසින් එයට පවරා දුන් කේන්ද්‍රීය භූමිකාව ද පශ්චාත් නූතනවාදීන් විසින් අත්‍යන්තයෙන් ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ගේ න්‍යායික සංකල්පනයන්ගේ තවත් සාරභූත අංගයක් සමග අවියෝජනීය ව බැඳී තිබේ - එනම් දාර්ශනික විමර්ශනයෙහි, කේන්ද්‍රීය බව පසෙක තිබියේවා, අර්ථභාරී අරමුන වසයෙන් වෛෂයික සත්‍යය ප්‍රතික්ෂේප කිරීම හා පැහැදිලිව බැහැර කිරීම යි.

එසේ නම් පශ්චාත් නූතනවාදය යනු කුමක් ද? පැහැදිලි කිරීමක් වසයෙන් මේ ප්‍රවනතාවේ ප්‍රමුඛතම විද්වත් ආරක්ෂකයකු වන මහාචාර්ය කීත් ජෙන්කිංස් විසින් රචිත ඡේදයක් උපුටා දැක්වීමට මට අවසර දෙන්නඃ

"අද අපි *පශ්චාත් නූතනත්වය* පිලිබඳ සාමාන්‍ය තත්වය තුල ජීවත් වන්නෙමු. මේ පිලිබඳ අපට තෝරාගැනීමක් නොමැත. පශ්චාත් නූතනත්වය යනු අපට එකඟ වීම හෝ නො වීම හෝ තෝරාගත හැකි 'දෘෂ්ටිවාදයක්' වත් ආස්ථානයක් වත් නො වන හෙයින්ත පශ්චාත් නූතනත්වය යනු නිශ්චිත ව ම අපගේ තත්වය යි, එය අපේ ඉරනම යි. මේ තත්වය විවාදාත්මක ලෙස උදා කරනු ලැබ තිබෙන්නේ නූතනත්වය වසයෙන් අප හඳුන්වන සමාජීය ජීවිතය පිලිබඳ අත්හදාබැලීමේ අසාර්ථකත්වය විසිනි - මේ අසාර්ථකත්වය විසි වන සියවස මත දුහුවිලි තැන්පත් වෙද්දී දැන් පැහැදිලි ව ම හඳුනා ගැනීමට පුළුවන. එහි ම කොන්දේසිවලින් මනිනු ලැබූ කල්හි දහ අට වන සියවස අවට කාලයේ පටන් යුරෝපයේ තර්කය, විද්‍යාව හා තාක්ෂනය යොදාගැනීම ඔස්සේ, සමාජ සැකැස්ම තුල පුද්ගලික හා සමාජීය යහ පැවැත්මේ මට්ටමක් උදා කිරීමට, සිය පුරවැසියන්ගේ/විෂයන්ගේ වර්ධනය වන්නා වූ විපුලිත විමුක්තිය උදෙසා ව්‍යවස්ථා සම්පාදනය මගින් දරන ලද ප්‍රයත්නයෙහි, අපට ඔවුන් "මානව හිමිකම් පිලිබඳ ප්‍රජාවන්" බවට පත් වීමට දැරූහ යි ගුනාංගීකරනය කල හැකි ප්‍රයත්නයෙහි සාමාන්‍ය අසාර්ථකත්වයකි එය.

"මේ නූතනය අත්හදා බලනු පිනිස උපකාරී වූ කිසිදු 'සැබෑ' පදනමක් දැන් නො පවතී - කිසි කලෙක පැවතියේ ද නැත."[1]

පශ්චාත් නූතනවාදීන්ගේ ම භාෂාව පරිහරනය කලහොත්, මේ ඡේදය 'විනිර්මිත' කිරීමට මට අවසර දෙන්න. දහ අට වැනි සියවස දක්වා පසුපසට දිවෙන අවුරුදු දෙසීයක් තිස්සේ විද්‍යාව හා බුද්ධිප්‍රබෝධයේ දර්ශනය විසින් ආවේශ ගැන්වුනු, මානව පරිපූර්නත්වය සාක්ෂාත් කිරීමේ හැකියාව ගැන විශ්වාසය තැබූ, ඉතිහාසයේ වෛෂයික නීතීන් තුලට යොමු වූ විද්‍යාත්මක ආලෝචනා හැටියට ඔවුන් විශ්වාස කල දෙයෙහි පදනම මත සමාජය විප්ලවවාදී ව පරිවර්තනය කිරීමට මෙහෙයවීගත් මිනිස්සු වාසය කලෝ ය.

පුද්ගලයාගේ ආත්මීය විඥ්ඥානයෙන් ස්වාධීන ව පවත්නා සමාජ ආර්ථික බලවේග මගින් නිර්නය කෙරුනු එහෙත් මිනිසාට සොයාගත හැකි, අවබෝධ කරගත හැකි හා මානව ප්‍රගතියේ අවශ්‍යතා උදෙසා ක්‍රියාවට නැගිය හැකි නීති පරිපාලිත ක්‍රියාවලියක් ලෙස එවැනි මිනිස්සු ඉතිහාසය (කැපිටල් එච් අකුර සහිත ව) විශ්වාස කලෝ ය.

එහෙත් මේ සකලවිධ සංකල්පනා ලාමක මායාවන් බව ඔප්පු වී ඇතැයි පශ්චාත් නූතනවාදීහු ප්‍රකාශ කර සිටිත්. අපි දැන් වඩා හොඳින් දන්නෙමු: (කැපිටල් එච් අකුර සහිත ව) ඉතිහාසය කියා දෙයක් නැත. හුදු වෛෂයික ක්‍රියාවලියක් හැටියට වත් අවබෝධ කරගැනුනු (කුඩා එච් අකුර සහිත) ඉතිහාසයක් පවා නැත. ඇත්තේ එම කර්තව්‍යය කවරක් හෝ වේවා, එක් හෝ වෙනත් ආත්මීය ව නිර්නිත ප්‍රයෝජනවත් කර්තව්‍යයක් සාක්ෂාත් කරගැනීම සඳහා සීරුමාරු කෙරෙන වාංමාලා සමග ක්‍රියාවෙහි යොදවනු ලැබූ හුදු ආත්මීය "ආඛ්‍යාන" හෝ "කතිකා" පමනි.

මේ ආස්ථානයේ සිට බලන විට "ඉතිහාසය" වෙතින් "පාඩම්" උපුටාගැනීමේ අදහස ම අවජාත ව්‍යාපෘතියක් වෙයි. ඇත්තෙන් ම අධ්‍යයනය කිරීමට කිසිවක් නැති අතර ඉගෙනගැනීමට ද දෙයක් නැත. ජෙන්කිංස් අවධාරනය කරන පරිදි, "පරම වසයෙන් ස්ව-විමර්ශී (කාව්‍යාලංකාරාත්මක) සංවාදවලින් ඔබ්බෙහි වූ කිසිදු වලංගු සත්භාවාත්මක හෝ ඥානවිභාගාත්මක හෝ ආචාරවිද්‍යාත්මක පදනමක් අපේ විශ්වාසයන් සඳහා නොපවතින සමාජ සැකැස්මවල් මධ්‍යයෙහි අප ජීවත් වන බව දැන් අපට සරල ව ම අවබෝධ කරගැනීමට සිදු ව තිබේ... එනයින්, කිසියම් අන්දමක සාරයක් ප්‍රකාශිත වූ අතීතයක් කියා දෙයක් කිසි කලෙක නොපැවති බවත් කිසි විටෙක පවතිනු ද නැති බවත් අපි අද හඳුනාගන්නෙමු."[2]

තේරෙන ඉංගිරිසියට පෙරලූ කල්හි ජෙන්කිංස් කියමින් සිටින්නේ මෙය යි: 1) අතීත හෝ වේවා වර්තමාන හෝ වේවා, මනුෂ්‍ය සමාජයන්ගේ ක්‍රියාකාරිත්වය සොයාගත හැකි හෝ සොයාගනයැම පවතින වෛෂයික නියාමයන්ට අනුකූල ව අවබෝධ කරගත නොහැකි ය. සහ 2) මිනිසුන් තමන් ජීවත් වන සමාජය පිලිබඳ සිතන, කියන හා කරන දෑ යටතින් පවත්නා වෛෂයික පදනමක් නැත. ඉතිහාසඥයින් ය යි කියාගන්නා පුද්ගලයින් අතීතය පිලිබඳ එක් හෝ තවත් අර්ථකථනයක් ඉදිරිපත් කල හැකි නමුදු - සම්පස්ථ විය හැකි වෛෂයික සත්‍යයක් නැති බැවින් - එක් අර්ථකථනයක් තවත් අර්ථකථනයක් මගින් විස්ථාපනය කරනු ලැබීම විසින් ඊට ප්‍රථමයෙන් රචිත දෙයට වඩා වෛෂයික ව සත්‍ය සම්පන්න වූ දෙයක් කරා වර්ධනය වීමක් ප්‍රකාශිත නොකෙරේ. එය හුදෙක් - ඉතිහාසඥයාගේ ආත්මීය ව ප්‍රත්‍යක්ෂ කරගැනුනු ප්‍රයෝජනයන්ට ගැලපෙන හේතු නිසා - එක් අන්දමක සිතීමක්, තවත් අන්දමක සිතීමක් මගින් විස්ථාපනය කිරීමකි.

මේ දෘෂ්ටියෙහි යෝජකයෝ නූතනත්වයේ අභාවය අවධාරනය කරන මුත් ඔවුන්ගේ නිගමන උපනයනය කරගැනුනු ඓතිහාසික හා දේශපාලනික විනිශ්චයන්ගේ සමස්ත සංකීර්නය විභාග කර බැලීම ප්‍රතික්ෂේප කරති. ඔවුන්ගේ න්‍යායික දෘෂ්ටීන්ට යටතින් පවත්නා වූත් එමගින් ප්‍රකාශනය සොයාගන්නා වූත් දේශපාලන ආස්ථාන ඔවුහු සත්තකින් ම දරති. පශ්චාත් නූතනවාදයේ ප්‍රමුඛ ප්‍රකාශකයකු වන මහාචාර්ය හේඩ්න් වයිට් පැහැදිලිව ම මෙසේ කියා ඇත: "සමාජ ධූරාවලියේ 'ඉහලින්' හෝ 'පහලින්' දියත් කෙරුනේ වේවා, සමාජය හා ඉතිහාසය පිලිබඳ විද්‍යාව දරා සිටිම්හ යි කියාසිටින්නා වූ හෝ දේශපාලන 'ස්වයංසිද්ධතාව' වර්නනා කරන්නා වූ හෝ නායකයින් විසින් මෙහෙයවනු ලැබුනේ හෝ වේවා විප්ලවවලට මම දැන් විරුද්ධ වෙමි."[3]

දෙන ලද දාර්ශනික සංකල්පනයක වලංගුතාව එය ඉදිරිපත් කරන පුද්ගලයාගේ දේශපාලනය මගින් ස්වයංක්‍රීය ව නිෂ්ප්‍රභ වන්නේ නො වේ. එහෙත් පශ්චාත් නූතනවාදයේ ප්‍රතිමාක්ස්වාදී හා ප්‍රතිසමාජවාදී පථය අතිශයින් විශද ය, එහි න්‍යායික සංකල්පනයන් එහි දේශපාලන ඉදිරිදර්ශනයෙන් ලිහා වෙන් කිරීම සැබෑ වශයෙන් ම කල නොහැකි තරම් ය.

මේ සබඳතාව සිය වඩාත් සවිස්තරාත්මක ප්‍රකාශනය සොයාගන්නේ ප්‍රන්ස දාර්ශනික ශොන් ප්‍රන්සුවා ලියොතාද්ගේ සහ ඇමෙරිකානු දාර්ශනික රිචර්ඩ් රොර්ටිගේ ලේඛන තුල යි. මම පලමුවැන්නාගෙන් අරඹමි. ලියොතාද් ඍජු ව ම සමාජවාදී දේශපාලනයේ නිරත ව සිටියේ ය. 1954 දී ඔහු හතරවන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාව වූ පී.සී.අයි (Parti Communiste Intanationaliste - ජාත්‍යන්තරවාදී කොමියුනිස්ට් පක්ෂය) සමග හටගත් භේදයකින් පසු 1949 දී මතු ව ආ සංවිධානයක් වූ *Socialisme ou Barbarie* (සමාජවාදය නැතහොත් ම්ලේච්ඡත්වය - පරි:) නම් කන්ඩායමට බැඳුනේ ය. එම භේදයට පදනම වූයේ පරිහානිගත කම්කරු රාජ්‍යයක් හැටියට සෝවියට්

සංගමය පිලිබඳ ට්‍රොට්ස්කිගේ නිර්වචනය මේ කන්ඩායම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම යි. කොර්නේලියස් කැස්ටෝරියාඩිස් හා ක්ලෝද් ලෆෝර් පුරෝගාමී න්‍යායිකයින් වසයෙන් සිටි *Socialisme ou Barbarie* කන්ඩායම, නිලධරය වනාහි පරපෝෂිත සමාජ ස්තරයක් නො ව නවතම සූරාකන්නවුන්ගේ සමාජ පන්තියක් බව කියන ආස්ථානයක් වර්ධනය කලෝ ය.

ලියොතාද් 1960 ගනන්වල මැද භාගය දක්වා ඔහු මේ කන්ඩායම තුල සිටියමුත් මාක්ස්වාදයෙන් සම්පූර්නයෙන් ම බිඳී වෙන් ව සිටියේ ය.

ලියොතාද් වැඩි වසයෙන් ම අනන්‍ය කෙරෙනුයේ මානව විමුක්තිය පිලිබඳ "මහා ආඛ්‍යාන" ප්‍රතික්ෂේප කිරීම සමග ය. ඒවායේ වලංගුතාව 20වන සියවසේ සිදුවීම් මගින් ප්‍රතික්ෂේප කර දැමුනේ ය යි ඔහු කියයි. හෙතෙම මෙසේ තර්ක කරයි:

"විමුක්තිය පිලිබඳ මහා ආඛ්‍යාන සියල්ලෙහි ම පදනම පසුගිය වසර පනහ තුල අවලංගු ව ගොස් තිබේ. යථා සියල්ල තාර්කික ය, තාර්කික සියල්ල යථා ය. "අවුෂ්විට්ස්" සමපේක්ෂනාත්මක ධර්මය නිෂ්ප්‍රභ කරයි. අඩු ගනනේ යථාවක් වූ එම අපරාධය තාර්කික වූයේ නැත. සියලු නිර්ධන පන්තික දෑ කොමියුනිස්ට්වාදී ය, සියලු කොමියුනිස්ට්වාදී දෑ නිර්ධන පන්තික ය. (වඩාත් විශද උදාහරන දෙන්නේ නම්) 1953 බර්ලිනය, 1956 බුඩාපෙස්ට්, 1968 චෙකොස්ලොවැකියාව, 1980 පෝලන්තය යන මේවා ඓතිහාසික භෞතිකවාදී මතවාදය නිෂ්ප්‍රභ කරයි: කම්කරුවෝ පක්ෂයට එරෙහි ව නැඟී සිටියහ. සියලු ප්‍රජාතාන්ත්‍රික දෑ ජනතාව හරහා ද ජනතාව සඳහා ද පවතී, එහි අනිත් පැත්ත නො වේ: '1968 මැයි' පාර්ලිමේන්තු ලිබරල්වාදී මතවාදය ප්‍රතික්ෂේප කරයි. නමුත් ඉඩ ලද හොත් සැපයුම හා ඉල්ලුම පිලිබඳ නියාමය විසින් ම විශ්ව ව්‍යාපී සමෘද්ධිය ජනනය කරනු ඇත, සහ එහි අනිත් පැත්ත: '1911 සහ 1929 අර්බුද' ආර්ථික ලිබරල්වාදයේ දර්ශනය නිෂ්ප්‍රභ කරයි."[4]

පශ්චාත් නූතනවාදය පිලිබඳ ලියොතාද්ගේ සමස්ත ව්‍යාපෘතියට ම යටතින් පවත්නා අන්දමන්දභාවයේ, අධෛර්යමත්භාවය, අසාරදර්ශනයේ හා ව්‍යාකුලත්වයේ සම්බන්ධනය මේ ඡේදය තුල සාරාංශගත ව ඇත. එය නිෂ්ප්‍රභ කිරීම සඳහා කෙනෙකුට පොතක් නො වේ නම් මුළු දේශනයක් ම වුව කැප කල හැකි ය. මෙහි දී මම කරුනු කිහිපයකට පමනක් මා සීමා කරගත යුත්තෙමි.

අවුෂ්විට්ස් ඉතිහාසය පිලිබඳ විද්‍යාත්මක අවබෝධයක් සඳහා වූ සකල විධ ප්‍රයත්න නිෂ්ප්‍රභ කරන්නේ ය යනු කිසි ලෙසකින් ලියොතාද් නිර්මානය කල තර්කයක් නො වේ. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ පීතෘවරුන් වූ ඇඩෝනෝ සහ හොර්ක්හයිමර්ගේ පශ්චාත්-ලෝක යුදකාලීන ලේඛනවල පදනම සකසන්නේ ද මේ හා සමාන අදහසක් විසිනි. අවුෂ්විට්ස් යථා හා අතාර්කික යන දෙක ම වී ය යන ලියොතාද්ගේ ප්‍රකාශය වනාහි හේගල්ගේ අපෝහක විප්ලවවාදී සංකල්පනයේ අතිසරල විකෘතියකි. ලියොතාද් කියාපාන නිෂ්ප්‍රභ කිරීම වූ කලී දාර්ශනික සංකල්පයක් හැටියට යථාව සහ පවත්නා දෙය ග්‍රාම්‍ය අන්දමින් අනන්‍ය කිරීමකි. එහෙත් එංගල්ස් පැහැදිලි කල පරිදි, හේගල් අවබෝධ කර ගත් සැටියට යථාර්ථය යනු "කිසිදු ලෙසකින්, දෙන ලද ඕනෑ ම සමාජීය හෝ දේශපාලනික සබඳතා තත්වයකට, සියලු තත්වයන් හා සියලු කාලයන් තුල අදාල වන්නා වූ උපලක්ෂනයක් නො වේ."[5] පවත්නා දෙය මානව සමාජයේ වෛෂයික සංවර්ධනය සමග අත්‍යන්ත ගැටුමක පැවතිය හැකි ය, එය සමාජීය ව හා ඓතිහාසික ව අතාර්කික, තව ද එහෙයින් අයථාර්ථවත්, පැවතිය නොහෙන සහ අභාවයට නියමිත විය හැකි ය. මේ ප්‍රගාඪ අර්ථයෙන් - නාසිවාදය හා අවුෂ්විට්ස් පැන නැංගා වූ - ජර්මානු අධිරාජ්‍යවාදය හේගල්ගේ දාර්ශනික ප්‍රෝක්තයෙහි සත්‍යය ආදර්ශනය කලේ ය.

ස්ටැලින්වාදයට එරෙහි ව කම්කරු පන්තියේ නැගිටීම්, ඓතිහාසික භෞතිකවාදය නිෂ්ප්‍රභ කලේ නැත. ඒ වෙනුවට ඒවා ලියොතාද් වැලඳගත් දජස්කසිපැ දම ඊර්ඉ්රසෑ කන්ඩායමේ දේශපාලනය නිෂ්ප්‍රභ කලේ ය. ට්‍රොට්ස්කි, විශ්ලේෂනය පිලිබඳ ඓතිහාසික භෞතිකවාදී විධික්‍රමයේ පදනම මත සිටිමින් එවැනි නැගිටීම් පෙරදැක තිබුනේ ය. පරපෝෂිත ස්තරයක් වසයෙන් තමන් සතු නො වූ පරිමානයේ බලයක් හා ස්ථාවරත්වයක් *Socialisme ou Barbarie* කන්ඩායම ස්ටැලින්වාදයට පවරා දී තිබුනි. තව ද ලියොතාද්, විප්ලවවාදී ව්‍යාපාරයක් වසයෙන් කොමියුනිස්ට්වාදය, සහ අන්‍යෝන්‍ය වසයෙන් ස්ටැලින්වාදී නිලධරයේ දේශපාලන සංවිධාන වූ, කොමියුනිස්ට් පක්ෂ අතර අනන්‍යකරනයක් ඇඟවුම් කරයි.

ආර්ථික හා පාර්ලිමේන්තු ලිබරල්වාදයේ නිෂ්ප්‍රභ වීම ගැන කියන විට, මාක්ස්වාදීන් මෙය ග්‍රහනය කරගෙන තිබුනේ ලියොතාද් සඳහන් කරන සිද්ධීන්ට බොහෝ පෙර සිට ය. පාර්ලිමේන්තු ලිබරල්වාදයේ කම්මුතු වීම හැටියට 1968 මැයි පිලිබඳ කෙරෙන ඔහුගේ සඳහන විශේෂයෙන් ම විකාරරූපී වෙයි. ස්පාඤ්ඤ සිවිල් යුද්ධය ගැන කිව හැක්කේ කුමක් ද? වෙයිමර් ජනරජයේ බිඳවැටීම ගැන? ප්‍රන්ස මහජන පෙරමුනේ පාවාදීම මේ සියලු සිදුවීම් හටගත්තේ 1968 මැයි-ජූනි කාලයට වසර තිහකටත් පෙර ය. මහා දාර්ශනික සොයාගැනීම් වසයෙන් ලියොතාද් ඉදිරිපත් කරන දෑ අපේක්ෂාභංගත්වයට පත් හිටපු-වාමාංශික (සහ දකුනට පැද්දෙන) උගත් සුලු ධනේශ්වරයේ අසාරදර්ශනයේ සහ නරුමවාදයේ ප්‍රකාශනවලට වැඩි යමක් වන්නේ යන්තමිනි.

වෛෂයික සත්‍යය පිලිබඳ සංකල්පනය ප්‍රතික්ෂේප කිරීම සමග විප්ලවවාදී සමාජවාදී දේශපාලනය බැහැර

කිරීම ආබද්ධ කිරීමේ දී රිචඩ් රෝර්ටි නිර්ලජ්ජී වෙයි. රෝර්ටිට අනුව නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ ඇදවැටීම හා සෝවියට් සංගමයේ විසුරුවා හැරීම, අවසාන වසයෙන්, විප්ලවවාදී සමාජවාදී ඉදිරිදර්ශනයක් උදෙසා වූ මොන ම අන්දමක වුව බුද්ධිමය (හෝ චිත්තවේගාත්මක පවා වූ) කැපවීමක් ඉවතලීම සඳහා බොහෝ කල් පටන් අපේක්ෂා කල අවස්ථාව වාම බුද්ධිමතුන්ට උදාකරදුන්නේ ය. " ලෙනින්වාදයේ, හැවල්ගේ සහ සමාජ අපේක්ෂාවේ අවසානය" නම් සිය රචනාවෙහි රෝර්ටි මෙසේ නිවේදනය කලේ යː

"ගැඹුරු, යටතින් පවත්නා බලවේග - මානව ප්‍රජාවන්ගේ ඉරනම නිර්නය කරන්නා වූ බලවේග - පිලිබඳ කිසියම් දෙයක් වූ ඔවුන් දැන සිටි අදහස නැතහොත් ඔවුන් දත යුතු වූ අදහස කෙරෙන් විමුක්ත වීමට බුද්ධිමතුන් ලෙනින්වාදයේ මලගම උපයෝගී කරගනු ඇතැයි මම අපේක්ෂා කරමි.

"බුද්ධිමතුන් වන අපි සාප්පුව ඇරපු දා පටන් ම එවැනි ඥානයකට හිමිකම් කියා පාමින් සිටියෙමු. රජුන් දාර්ශනිකයින් බවටත් දාර්ශනිකයින් රජුන් බවටත් පත් වන තුරු යුක්තිය රජයනු නැතැයි දන්නා බව අපි වරක් කියා සිටියෙමුත ඉතිහාසයේ හැඩය සහ චලනය ග්‍රහනය කරගැනීමේ පදනම මත මෙය දන්නා බව අපි කියා පෑවෙමු. කුඩා පර්යේෂනාත්මක මාර්ගවලට ප්‍රතිපක්ෂ ව අයුක්තිය නිමා කරන්නේ කෙසේ ද යන්න සොයාගැනීම සඳහා මහා න්‍යායික මාර්ග පැවතිය යුතු ම ය යන ප්ලේටෝට සහ මාක්ස්ට පොදු වූ ස්ථාවරයෙන් අවසාන වසයෙන් මිදී ගැනීමට හැකියාව ලැබෙන කාලයකට අප සම්ප්‍රාප්ත ව ඇතැයි මම අපේක්ෂා කරමි."[6]

එවැනි න්‍යායික නිෂ්ක්‍රමනයකින් පසු පැමිනෙනු ඇත්තේ කුමක් ද? රෝර්ටි "වාම" දේශපාලනය යලි සැකසීම සඳහා සිය යෝජනා මෙසේ ඉදිරිපත් කරයිː

"...වාමාංශයේ දේශපාලන වාංමාලාවෙන් 'ධනවාදය' හා 'සමාජවාදය' යන පද හලා දැමීමට කාලය එලඹ ඇතැයි මම කල්පනා කරමි. 'ධනවාද විරෝධී අරගලය' ගැන කතා කිරීම නවත්වා සියල්ලන්ට ම පොදු වූ න්‍යායික නො වූ කිසියම් දෙයක් - 'වලක්වාගත හැකි මානව අභාග්‍යයන්ට එරෙහි අරගලය' වැනි දෙයක් - ඒ වෙනුවට යෙදීම හොඳ අදහසක් වනු ඇත. වඩා පොදුවේ ගත් කල, වාමාංශික දේශපාලන විචාරනයේ සමස්ත වාංමාලාව ම අපට වැදගැම්මකට නැති දෙයක් කරගත හැකි ය යි මම අපේක්ෂා කරමි. ධනේශ්වර දෘෂ්ටිවාදය ගැන වෙනුවට තන්හාව සහ ආත්මාර්ථකාමීත්වය ගැනත්, ශ්‍රමය හුවමාරු භාන්ඩයක් බවට පත් වීම ගැන වෙනුවට සාගින්න, වැටුප් සහ සේවා අතිරික්තය ගැනත් සමාජය පන්තිවලට බෙදී තිබීම ගැන වෙනුවට පාසැල්වල ශිෂ්‍යයකුට දරන වියදමේ අසමානකම් හා සෞඛ්‍ය සේවාවට ඇති අසමාන ප්‍රවේශය ගැන කතා කිරීම ආරම්භ කල යුතු ය යි මම යෝජනා කරමි."[7]

ඉතින් "දර්ශනය" කියන්නේ මෙයට ද? වැදගැම්මකට නැති දෙයක් බවට පත් කිරීම හැටියට රෝර්ටි හඳුන්වන දෙය බුද්ධිමය හා දේශපාලනික කප්පාදු කිරීමක් ලෙස වඩා හොඳින් හැඳින්විය හැකි ය. වසර 200කට වඩා පැරනි සමාජ චින්තනයේ නිෂ්පාදිතය සාකච්ඡාවෙන් බැහැර කිරීමට ඔහු යෝජනා කරයි. මේ යෝජනාව යටතින් පවත්නේ චින්තනයේ සංවර්ධනය මත් ශුද්ධ වසයෙන් හිතුවක්කාරී සහ විශාල වසයෙන් ආත්මීය වූවකියි පැවසෙන සංකල්පනය යි. වචන, න්‍යායික සංකල්ප, තාර්කික ප්‍රවර්ග හා දාර්ශනික පද්ධති වනාහි විවිධාකාර වූ ආත්මීය නිෂ්ඨාවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රයෝජ්‍යතාවාදී ලෙසින් මවාගනු ලැබූ හුදු වාචික නිර්මිත පමනක් වෙයි. න්‍යායික චින්තනයේ වර්ධනය වනාහි පරිනාමය වන, ගැඹුරු වන සහ චිර-සංකීර්න හා නිශ්චිත වූ ස්වභාවධර්මය සහ සමාජය පිලිබඳ මිනිසාගේ අවබෝධය ප්‍රකාශිත කරන වෛෂයික ක්‍රියාවලියක් වන්නේ ය යන ප්‍රකාශය රෝර්ටි සම්බන්ධයෙන් සලකන කල හේගලියානු-මාක්සියානු මනස්ගාතයකට වැඩි යමක් නො වේ. ඔහු තවත් ඡේදයක කියා සිටින පරිදි, "ස්වාභාවික විද්‍යාඥයින් විශේෂයෙන් සමත්කම් පාන සොයාගනු ලැබිය යුතු වූ ස්වභාවයකින් යුක්ත 'දැනගැනීම' නමැති ක්‍රියාවලියක් නොපවතී, ඇත්තේ හුදෙක් ශ්‍රාවකයන් හමුවේ විශ්වාසයන් සාධාරනිකරනය කිරීමේ ක්‍රියාවලියකි."[8]

ඉතින් "ධනවාදය," "කම්කරු පන්තිය," "සමාජවාදී," "අතිරික්ත වටිනාකම," "වැටුප්-ශ්‍රමය," "සූරාකෑම," හා "අධිරාජ්‍යවාදය" වැනි පද වෛෂයික යථාර්ථයක් ප්‍රකාශිත කරන සහ ඇඟවුම් කරන සංකල්ප නො වේ. ඒවා අපේක්ෂිත පරිදි අඩු චිත්තවේගාත්මක භාෂාවකින් - රෝර්ටි නො ව අප බොහෝ දෙනෙක් මෘදුක්තිය ලෙසින් හඳුන්වනු ඇති වෙනත් යමකින් විස්ථාපනය කල යුතු ය.

මා කලින් උපුටා දක්වා ඇති පරිදි රෝර්ටි " වලක්වාගත හැකි මානව අභාග්‍යයන්" පිලිබඳ ව අප කතා කල යුතු ය යි යෝජනා කරයි. අපි මොහොතකට මේ දීප්තිමත් යෝජනාව පිලිගෙන බලමු. එහෙත් ඒ සැනෙකින් ම වාගේ අපි ප්‍රශ්නයකට මුහුන පාන්නෙමු. කවර ස්වරූපයේ හා පරිමානයේ මානව අභාග්‍යයන් වලක්වාගත හැකි වේ දැයි අප නිර්නය කරන්නේ කෙසේ ද? අභාග්‍යය වලක්වාගත හැකි බව හෝ නොහොත් වලක්වාගත යුතු බව පවා අප කියන්නේ කවර පදනමක් මත ද? අභාග්‍යය වන්නේ මිනිසාගේ ඉරනම ය යි ද දේවාශිර්වාදයෙන් බැහැර වීමේ ප්‍රතිඵලය යයි ද කියන්නෙකුට දිය හැකි පිලිතුර කුමක් ද? දේවධර්මවාදීන්ගේ තර්ක කෙසේ හෝ මගහැර ලෞකික අරුතින් සමාජ ගැටලුවක් හැටියට අභාග්‍යය ග්‍රහනය කරගත්ත ද අපි තව මත් අභාග්‍යයේ හේතූන් විශ්ලේෂනය කිරීමේ ගැටලුවට සම්මුඛ ව සිටිමු.

"වලක්වාගත හැකි මානව අභාග්‍යය" අහෝසි කරලීමේ වැඩසටහනකට සමාජයේ ආර්ථික ව්‍යුහය විශ්ලේෂනය කිරීම සඳහා බල කෙරෙනු ඇති. සැලකිය යුතු පරිමාවක අවංකත්වයෙන් යුතු ව එවැනි පරීක්ෂාවක් පවත්වන දුරෙහි ප්‍රමානයට "වලක්වාගත හැකි මානව අභාග්‍යයට" එරෙහි ව යුද වදින්නන්ට " හිමිකම," "දේපල," "ලාභය," සහ "පන්තිය" පිලිබඳ ගැටලු මුනගැසෙනු ඇති. මේ සමාජ ප්‍රපංච විස්තර කිරීමට ඔවුන් අලුත් වචන නිපදවනු ඇති නමුදු - රොර්ටිගේ අවසරය ඇති ව හෝ නැති ව - කෙසේ වෙතත් එම ප්‍රපංච පවතිනු ඇත.

රෝර්ටිගේ න්‍යායික සංකල්පනා අතිශය අසංස්ථිතතාවන්ගෙන් හා ප්‍රතිවිරෝධයන්ගෙන් ගහන ව තිබේ. සොයාගනු ලැබීමට හා දැනගනු ලැබීමට කිසිදු "සත්‍යයක්" නැතැයි ඔහු පැහැදිලි ව ම අවධාරනය කරයි. අනුමාන කල හැකි ලෙස ඔහු "සත්‍යයෙහි" නො පැවැත්ම පිලිබඳ සිය සොයාගැනීම උසුලා සිටින්නේ හරියට එය සිය දර්ශනයේ පදනම සකස් කරන්නාක් මෙනි. එහෙත් ඔහුගේ බරපතල අසංස්ථිතතාවන් ගැන පැහැදිලි කරන මෙන් ඉල්ලා සිටිනු ලැබුවොත් ප්ලේටෝ දක්වා දිවෙන සාම්ප්‍රදායික දාර්ශනික කතිකාවෙහි මුල්බැසගත් එම ප්‍රශ්නයේ නීතිවලට යටත් නොවන බව කියමින් රෝර්ටි ප්‍රශ්නයෙන් මගහැර යයි. සත්‍යය යනු සරල ව ම කෙනෙකුට සිත්ගන්නාසුලු දාර්ශනික සාකච්ඡාවක් කල නොහැකි, දැන් යල් පැන ගොස් ඇති ප්‍රශ්නවලින් එකකියි රෝර්ටි අවධාරනය කරයි. ප්‍රශ්නය පැන නඟින කල්හි, ඔහු නරුම ආකාරයෙන් සඳහන් කර ඇති අන්දමට රෝර්ටි "සරල ව ම මාතෘකාව වෙනස් කිරීමට කැමති ය."[9]

රෝර්ටිගේ දාර්ශනික සංකල්පනයන් අවබෝධ කරගැනීමේ යතුර ඔහුගේ දේශපාලන ආස්ථාන තුල සොයාගත හැකි ය. විවිධ අවස්ථාවන්හි දී රෝර්ටි දර්ශනය හා දේශපාලනය අතර සම්බන්ධය අවතක්සේරු කිරීමට ඉදිරිපත් ව ඇති මුත් සිය දාර්ශනික සංකල්පනයන් අතිශයින් ම ඍජු අන්දමින් දේශපාලන ආස්ථානයක් තුල - එනම් මාක්ස්වාදී විප්ලවවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම හා එයට එරෙහි වීම තුල - මේ තරම් ගිලී පවත්නා වෙනත් දාර්ශනිකයකු සොයාගැනීම අපහසු ය. මාක්ස්වාදය ක්‍රමානුකූල ව විශ්ලේෂනය කිරීමට හා නිෂ්ප්‍රභ කිරීමට රෝර්ටි වෑයම් නොකරයි. මාක්ස්වාදය හරි හෝ වැරදි වීම රෝර්ටිට කාරනයෙන් බැහැර දෙයකි. සමාජවාදී ව්‍යාපෘතිය (මෙය රෝර්ටි විශාල වසයෙන් සෝවියට් සංගමයේ ඉරනම සමග අනන්‍ය කරයි) අසාර්ථක විය, එහෙයින් රෝර්ටි සම්බන්ධයෙන් ගත් කල අනාගතයේ දී එය සාර්ථක වීම පිලිබඳ ව ඇත්තේ සුලු අපේක්ෂාවකි. පැරනි මාක්සියානු වාමාංශයේ සුන්බුන් අතරින් ආරක්ෂා කර ගත යුතු දෙයක් නැත. ඉතිහාසය, මූලධර්ම, වැඩපිලිවෙලවල් සහ සියල්ලට මත් වඩා නරක අන්දමින් වෛෂයික සත්‍යය යනාදිය පිලිබඳ නව දාර්ශනික අරගලයන්හි නිරත වනවා වෙනුවට අවම පොදු හරයට අයත් මධ්‍යස්ථ දේශපාලනයට පසුබැසීම යහපති. රෝර්ටිගේ - සහ සත්තකින් ම ඇමෙරිකානු පශ්චාත් නූතන කතිකාවෙන් වැඩි කොටසක - දර්ශනය වන්නේ ඇත්තෙන් ම මෙය යි.

රෝර්ටිට (සහ අප ඉදිරියේ දී දකිනු ඇති පරිදි වෙනත් බොහෝ දෙනෙකුට ද) "1989 සිදුවීම් මාක්ස්වාදයට බැඳී සිටින්ට වෑයම් කල උදවියට කාලයේ චින්තනයට අයත් වීමට මගක්, සහ ධනවාදයට, ධනේශ්වර ජීවන විලාසයන්ට, ධනේශ්වර දෘෂ්ටිවාසයට හා කම්කරු පන්තියට විමර්ශනය යොමු කරන්නා වූ අනාගතය වර්තමානයට වඩා යහපත් කිරීම සඳහා වූ සැලැස්මක් අපට අවශ්‍ය බව ඒත්තුගැන්වී ය."[10] ඔහු මෙසේ තර්ක කරයිඃ "පහ ව ගිය අභාග්‍යයන් පිලිබඳ මනස්සෘෂ්ටීන් ඒ වටා වියාගැනීමට හැකි වස්තුවක නමක් හැටියට 'ඉතිහාසය' පරිහරනය කිරීම නතර කිරීමට කාලය එලඹ තිබේ. ෆ්‍රැන්සිස් ෆුකුයාමා (මහත් වර්නනාවට පාත්‍ර වන *ඉතිහාසයේ අවසානය* නම් රචනාව තුල) කියන මේ කරුනට අපි ඉඩ දිය යුත්තෙමුඃ ඔබ තව මත් ලෝක-ඓතිහාසික පරිමානයෙන් රැඩිකල් අනෙකා උදෙසා, සමස්ත විප්ලවයක් උදෙසා අභිලාෂී වන්නේ නම් 1989 සිදුවීම් ඔබට ඒ වාසනාව නැති බව පෙන්වා දෙනු ඇත."[11]

මේ අන්දමේ නරුම සහ අදක්ෂ උත්ප්‍රාසය වනාහි ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ වැටීමෙන් පසු පැමිනි දේශපාලන ප්‍රතිගාමීත්වය හමුවේ වාම බුද්ධිමතුන් හා රැඩිකලුන්ගේ අවකාශය සිසාරා පැතිර ගිය බලසුන් බව හා දූෂිත බව පිලිබඳ ප්‍රකාශනයකි. ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳී විසිරීමට තුඩු දුන් ඓතිහාසික, දේශපාලනික, ආර්ථික හා සමාජීය මූලයන් පිලිබඳ බැරෑරුම් විශ්ලේෂනයක් සඳහා ප්‍රයත්න දරනු වෙනුවට මේ ප්‍රවනතාවෝ පවත්නා ප්‍රතිගාමීත්වයේ, ව්‍යාකූලත්වයේ හා අසාරදර්ශනයේ වාතාවරනයට වහා අනුගත වූහ.

*මතු සම්බන්ධයි.*

## සටහන්

1 *On "What is History?" ("ඉතිහාසය යනු කුමක් ද?" ගැන) ලන්ඩන් සහ නිව් යෝර්ක්, 1995, 6-7 පිටු.*
2 එම, 7 පි.
3 *The Content of the Form: Narrative Discourse and Historical Representation* (ආකෘතියේ අන්තර්ගතයඃ ආඛ්‍යාන කතිකා සහ ඓතිහාසික නියෝජනය) බැල්ටිමෝර්, 1990, 63 පි.
4 සිමොන් මැල්පස්,
*Jean-François Lyotard*, (ශොන් ෆ්‍රන්සුවා ලියොතාද්) හි උපුටා දක්වා ඇත. ලන්ඩන් සහ නිව් යෝර්ක්, රූට්ලෙජ්, 2003, 75-76 පිටු.

[5] මාක්ස් සහ එංගල්ස් *Collected Works,* Volume 26 (එකතු කල කෘති, වෙලුම 26), ප්‍රෝග්‍රස් පබ්ලිශර්ස්, 1990), 358 පි.
[6] *Truth and Progress* (සත්‍යය සහ ප්‍රගතිය) කේම්බ්‍රිජ්, 1998, 228පි.
[7] එම, 229 පි.
[8] *Philosophy and Social Hope* (දර්ශනය සහ සමාජ අපේක්ෂාව) ලන්ජන් සහ නිව් යෝර්ක්, 1999, 36 පි.
[9] ජෙන්කිංස් උපුටා දක්වා ඇත, 103පි.
[10] *Truth and Progress,* (සත්‍යය සහ ප්‍රගතිය), 233 පි.
[11] එම